www.kidworship.kr

# The Prodigal Son

–The Prodirgal Son–



68Page

**පොතේ ගුරා** එකමත් එක කාලයක, කුඩා නගරයක පියෙක් සහ පුතාලා දෙන්නෙක් ජීවත් වුණා. මේ තාත්තා පුතාලා දෙන්නටම ගොඩක් ආදරෙයි. ලොකු පුතා තමුන්ගේ පියාට හරිම කීකරු කෙනෙක්. නමුත් බාල පුත්‍රයා හරිම සෙල්ලක්කාරයෙක්. සෙල්ලම් ජීවිතයකට නිතරම් ලොල් වූ කෙනෙක්. එක දවසක්දා මේ බාල පුතා, මක්නිසාද තමුන්ට රිසි රිසි දේවල් කරමින් ජීවත්වෙන්න අවශ්‍යයි කියා සිතුවා. එනිසා නිවසෙන් පිටත්වී තමුන් තනියෙන් නිවසෙක ජීවත්වෙන්න තීරණය කළා.

**බාල පුත්‍රයා** තාත්තේ ඔයාගේ දේපලවලින් මේ දැන්මම මගේ කොටස දෙන්න! මට ගෙදරින් ගිහින් තනියම ජීවත්වෙන්න ඕන!

**පියා** මොකක් ?? පුතා මේ ලෝකට ජීවත්වෙන්න හරිම අමාරු තැනැක්. ඔයා මේ ගැන තවත් ටිකක් හිතලා බැලුවොත් හොඳයි නේද?

**බාල පුතා** තාත්තේ - මම පොඩි ළමයෙක් නොවේ දැන් ! මට තනියෙන් ජීවත්වෙන්න හොඳටම පුලුවන්.

**පොතේ ගුරා** බාල පුතා ගෙදරින් යාම සම්බන්ධව පියාට දුක හිතුණත් දරුවන්ගේ දෙන්නගේම දේපල ඔවුන් අතරේ බෙදා දී, බාල පුතාගේ කොටස ඔහු ඉල්ලූ ආකාරයටම ඔහුට ලබාදෙනවා.

.................................................................................................



69Page

**පොතේ ගුරා** කාලය ගතවන්නට පෙර බාල පුතා තමුන්ගේ දේපල රැගෙන තාත්තාගේ නිවසෙන් පිටත්වෙනවා. ඔහු ගියේ දර්ශණීය මනරම් නගරයකටයි, එහෙදී එයා තමුන්ට කැමති කැමති දේ කළා. තමුන්ට කරන්න සිතුණ සෑමදේම කළා. කන්න බොන්න කැමති දේවල් කෑවා-බීවා. ගන්න ඕන දේවල් මොනවද, ඒ දේවල් ඔක්කොම ගත්තා. මේ වගේ තමුන්ට කැමති දේ කරමින් ජීවත්වුණා.

**බාල පුතා** මේක නියමයි ! මට ඕන ඕනම දෙයක් කරන්න පුලුවන් ! මම මීට කලින් නේ තාත්තගේ ගෙදරින් යන්න තිබුණේ !

**පොතේ ගුරා** හැමදාම රෑට බාල පුතා එයාගේ අලුත් මිතුරන් එකතුකරගෙන අධික වියදමකින් යුත් කෑම කමින්, මිල අධික වයින් බීව්වා. ඒ විතරක්ද මුතුමැණික් සහ මිල අධික ඇඳුම්-පැළඳුම් පැළඳගත් ඔහු කුමාරයෙක් වගේ හිටියේ. ඒත් මෙහෙම යද්දී ඔහු තමුන්ගේ සිතුමතේ ජීවත්වීම හේතුවෙන් තමුන්ගේ සෑම දේපලක්ම නැතිකර ගත්තා.

.................................................................................................



70Page

**පොතේ ගුරා** ඔහුගේ සියලුම මුදල් නැතිවෙලා යද්දී ඔහුගේ මිතුරන්ද ඔහු අතහැර ගියා . බාල පුතා අතේ සතේ නැතිව තනිවුණා. බඩගින්නේ එපාවෙලා සිටි බාල පුතා අන්තිමට ස්වාමියෙක් ළඟ වැඩකාරයෙකු ලෙසින් බැඳුනා. මේ ස්වාමියා පොඩි පුතාට කතාකර දැන් මෙහෙම කියනවා.

**ස්වාමියා** ඒයි මෙහෙ එන්න ! ඔයා මීට වඩා වේගයෙන් වැඩ කරන්න ඕන. ඔයා ඌරූ කොටවු සුද්ද කරන්නත් ඕන, ඒවගේම උන්ට කෑම දාන්න ! ඉක්මණින් ! හ්ම්! හ්ම්!

**බාල පුතා** ආහ්... මම කුසගින්නෙන් පෙළෙනවා, අම්මෝ බඩගිනියි, ඌරන්ට කන්න දාන්න තියෙන එකෙන්වත් මට මගේ බඩ පුරවගන්න තිබුණානම් (ඉහ්ඉහි-ඉහි-අඬනවා).

**පොතේ ගුරා** බාල පුතා බොහොම දුකට පත්වෙලා සිටියේ. එයාට එකපාරටම තාත්තාගේ ගෙදර මතක් වුණා. එයාගේ තාත්තා දකින්න එයාට ලොකු අසාවක් ඇති වුණා.

**බාල පුතා** මම මොනව කළත් මගේ තාත්තා මට ආදරෙයි. තාත්තාගේ වැඩකාරයන් කීදෙනෙකුට වැඩිපුරත් කෑම තියෙනවද? ඒත් මම මෙතැන කුසගින්නේ මැරෙනවා. මේක හරියන්නේ නෑ. මම ආයෙත් තාත්තා ළඟට ගිහින් එයාගෙන් සමාව ඉල්ලලා, එයාගේ සේවකයෙක් ලෙස සලකන්න කියා ඉල්ලනවා.

.............................................................................................



71Page

**පොතේ ගුරා** පොඩි පුතා නැවතත් තමුන්ගේ රටට යනවා. ඒත් තාත්තාගේ ගෙදරට ළංවෙන්න ළංවෙන්න ඔහු කනස්සලු වෙන්න පටන්ගන්නවා.

**බාල පුතා** තාත්තා මට සමාව දෙන්න කැමති නැත්තන් ? මම එයාගේ දේපල ඔක්-කොම නාස්ති කරලා, දැන් දුප්පත් හිඟන්නෙක් වගේ. ඒ නිසා සමාව නුදුන්නොත් මම පුදුමවෙන්නෙත් නෑ. එතකොට මම මොකද කරන්නේ ? (ඉහ්ඉහිඉහි-අඬනවා).

**පොතේ ගුරා** බාල පුතා අඬමින් එයාගේ තාත්තගේ ගෙදර පැත්තට ඇවිදගෙන ආවා. එයා ඈතින් එනවා, දොර ළඟ සිටි තාත්තා දකිනවා. බාල පුතා ගෙදරින් ගිය දවසේ ඉඳලාම නැවත ඔහු ගෙදරට එනතුරු තාත්තා බලා සිටියා. බාල පුතා දුටු ගමන්ම තාත්තා දුවගෙන ඉදිරියට ගොස් එයාව බදාගත්තා.

**බාල පුතා** තාත්තේ ! මම මහා පව්කාරයෙක්. මට ඔයාගේ පුතා කියන්නවත් වටින්-න් නෑ. ඒ නිසා දැන් මාව ඔයාගේ සේවකයෙක් ලෙස තියාගන්න.

**තාත්තා** මගේ ආදර පුත්‍රය, ඔයවගේ හිතන්න එපා. මම ඔයා එනකං හැමදාම බලාගෙන හිටියා. ඔයා මගේ දේපල ඔක්කොම අරගෙන ගෙදරින් යද්දීත් මම ඔයාට ආදරේ කළා. මම අදත් ඔයාට ආදරෙයි. ඔයා මගේ ආදරණීය පුතා !

.............................................................................................



72Page

**පොතේ ගුරා** තාත්තා තමුන්ගේ සේවකයන් හඬ ගැසුවා.

**පියා** ඉක්මණින් ! තිබෙන හොඳම ඇඳුම ගෙනත් මේ මගේ පුතාට හඳවන්න. එයාගේ ඇඟිල්ලේ මුදුවක් පළඳලා, පාදවලට වහන් දමන්න. තරකළ වස්සා ගෙනැවිත් මරන්න. දැන් සාදයක් පවත්වන්න... මේක සමරන්න ...

**පොතේ ගුරා** තාත්තා, බාල පුතා නැවත ගෙදර පැමිණීම ගැන ප්‍රීතිමත් වී, ලොකු සාදයක් පැවැත්වුවා. තාත්තාගේ සදාකාලික අසමත් නොවන ආදරය ගැන පුතා හොඳින් අවබෝධ කරගත්තා.



73Page

**ජීවිතයට අදාල කිරීම**

දුවේ, පුතේ, සමහර අවස්ථාවලදී අපිත් දෙවි පියාණන්වහන්සේට විරුද්ධව වැරදි, පව් වැඩ කරනවිටදී, අපේ දෙවිපියාණන්වහන්සේ අපි නැවත හැරිලා එනතුරු ආදරෙන් බලා සිටිනවා. ඒ නිසා අදම අපි අපේ අතින් වුණ වරදි කියාගෙන දෙවිපියා ළගට යමු නේද?